# යටිදෑරිය සූරියමල්ගම සමූපකාර ගම්මානය

කෑගල්ල දිස්ත්‍රික්කයේ යටියන්තොට ඡන්ද කොට්ඨාශයේ යටිදෑරිය වතු යායේ කොටසක කෘෂිකර්ම අමාත්‍යාංශයේ සමූපකාර ගම්මාන වැඩ සටහන යටතේ ''සූරියමල්ගම'' සමූපකාර ගම්මානය පිහිටුවා තියෙනවා.

මෙ ගම්මානයේ පදිංචි කරවීමට තෝරා ගෙන තියෙන්නේ ඒ අවට ගම්වල අවුරුදු 18 ටත් 35 ටත් අතර අවිවාහක තරුණ පිරිසක්. මෙ තරුණයින්ගෙන් සියයට හැත්තෑවක් පමණ එතරම් හොඳ ඉගෙනීමක් ලබාපු අය නෙවෙයි. තරුණයින් පස් දෙනෙක් ජ්‍යෙෂ්ඨ විභාගෙන් සමත් වෙලා ඉන්නව. එක් තරුණයෙක් ඊටත් වැඩිය ඉහලට ඉගෙන ගෙන තියෙනව. 1972 නොවැම්බර් මාසයේ 18 වෙනිද තරුණියින් 13 දෙනෙකුගෙන් පටන් ගත්ත මේ සමූපකාරයේ දැන් සාමාජිකයින් 72 ක් ඉන්නවා. ඒ අයට දැනට ලැබෙන්නේ යැපීමට සුළු දීමනාවක් විතරයි. ඒ වුනත් මේ ගම්මානයේ උපදවන දේවල්වලින් පසුව ලාබ ලැබෙන විට, ඒ ලාබය බෙදා ගැනීමේ අයිතිය සාමාජිකයින්ට තියෙනව.

අක්කර 300 ක ඉඩම් ප්‍රමාණයක් මේ තරුණයින්ට දීමට පෙර, ප්‍රාදේශීය කෘෂි කර්ම ව්‍යාප්ති නිලධාරීන්, සත්ව පාලන නිලධාරීන්, පශු වෛද්‍ය සහ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ උපදේශකයින් කිහිප දෙනෙක් ඉඩම පරීක්ෂා කළා. එහෙම කළේ මොන විදියේ බෝග වර්ග එම ඉඩමේ වගා කළ යුතුදැයි දැන ගැනීමටයි. ඉඩමේ පස මොන බෝගවලට සුදුසුද, වතුර ලබා ගැනීමේ පහසුකම් මොනවාද, පලදාව පහසුවෙන් විකුණා ගැනීමට වෙළඳ පොලක් තියෙනවද, ආදිය නිරාකරණය කර ගන්නට ඔව්හු උත්සාහ කළා.

ඉඩමේ පසෙහි තත්වය ගැන පස් පරීක්ෂකවරුන්ගේ වාර්තා ලැබුනාට පස්සේ එහි පදිංචි කරවන තරුණයින්ගෙන් ද අදහස් විමසල, වගා කළයුතු දේවල පිළිබඳව වැඩ සැලැස්මක් පිළියෙල කළා. ඊට පසුවයි, මෙම තරුණයින් බිම එළි පෙහෙලි කිරීමට පටන් ගත්තේ. සූරියමල්ගම සමූපකාර ගම්මානයේ තරුණ සාමාජිකයන් සඳහා සකස් කර ඇති 72/73 සංවර්ධන සැලැස්ම පහත දක්වා ඇති විදියටයි,

මුළු භූමි ප්‍රමාණය අක්කර 312 යි.
දැනටමත් ප්‍රයෝජනයට ගන්නා තේ සහ රබර් අක්කර 67 යි.
වගා කළ යුතු භූමි ප්‍රමාණය අක්කර 215 යි.

මේ අක්කර 215 න් අක්කර 30 ක වැල් දෙඩම්, අක්කර 15 ක එළවළු, අක්කර 10 ක අල වර්ග සහ අක්කර 5 ක කෙසෙල් වගා කිරීමට අදහස් කරනවා. අක්කර 16 ක් තණ බිමක් සඳහාත්, තවත් අක්කර 5 ක් ගව ගාලක් සඳහාත් වෙන් කර තියෙනවා.


බිම එළි පෙහෙලි කිරීම, අවශ්‍ය ද්‍රව්‍ය ආදිය සපයා ගැනීම, රබර් කිරි කැපීම ආදී ගොවිපලේ එදිනෙද වැඩ කටයුතු හැම එකක්ම මෙහි සිටින තරුණයෝ ඉටු කරනව. මේ වැඩ කටයුතු මෙහෙයවීමට ඒ තරුණයින් අතරින්ම නායකයෙක් ඉදිරිපත්වී ඉන්නව. නායකයෙක් හැටියට වැඩ කටයුතු මෙහෙයවීම ඔහුට බාරව තිබුණත්, අනික් තරුණයින් වගේම ඔහුත් ගොවි පලේ වැඩ කරනවා. මුදල් හදල්වල, ලිය කියවිලිවල වැඩ කටයුතු ගැන මොහුට උදව් වීමට තව තරුණයෙක් ව්‍යාපාර කළමනාකරු හැටියට පත් කරගෙන ඉන්නව. ඒ තරුණයා තමයි ඔවුන් අතර වැඩිම ඉගෙනීමක් ලබා ඇත්තේ නොයෙකුත් සේවාවන් හා මුදල් ප්‍රමාණය ආදිය අනුමත කරන්නේ ඒ පළාතේ ප්‍රාදේශීය ආදායම් නිලධාරිගේ මූලිකත්වයෙන් ඇති අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින්. මේ අධ්‍යක්ෂ මණ්ඩලයට සමූපකාර ගම්මානයේ තරුණ සාමාජිකයින් දෙදෙනෙක් ද අයිති වෙනවා.

මේ තරුණයින් සියළු දෙනාම ඉන්නේ එක නේවාසිකාගාරයකයි. ඔවුන් සියළු දෙනාම එක්ව උයා පිහා ගන්නවා. ඔවුන් විසින්ම

ආහාර කමිටුවක් පිහිටුවා ඇති අතර, කුස්සියේ වැඩ කටයුතු ඒ කමිටුවට බාර වෙලා තියෙනවා.

මේ ව්‍යාපාරයේ තරුණ සාමාජිකයින් අතර වැඩ කටයුතු මෙහෙයවන **එච්. ධර්මසේන** මහතා සූරියමල්ගම සමුපකාර ගම්මානය පිළිබඳව ඔහුගේ අදහස් ප්‍රකාශ කළේ පහත දක්වා ඇති විදියටයි.

''මගේ නම **ධර්මසේන**. වයස අවුරුදු 28 යි. මම පස්වන පංතියට ඉගෙනීම ලබා තියෙනවා. වැල් දෙඩම් වගාව පිළිබඳව වාගොල්ලේ රජයේ ගොවිපලේ පුහුණුවක් ලැබුවා. සමුපකාර ගම්මානවල අත්දැකීම් ගැන සාකච්ඡාවකටත් එහිදී සහභාගි වුනා. මම අනික් තරුණයින් වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේද සාමාජිකයෙකු හැටියට කටයුතු කරනවා. සාමාජිකයෝ ගොවිතැන් වැඩ කටයුතුවලදී පෙන්වා දෙන අඩුපාඩුකම් මම අධක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනවා. අද දිනත් (1973 නොවැම්බර් 23) අධක්ෂ මණ්ඩලයේ රැස්වීමක් පැවැත්වෙන නිසා අපි තීරණය කරල තියෙනවා, රෝද දෙකේ ට්‍රැක්ටරයක් නැත්නම් දැන් තියෙන ට්‍රැක්ටරයට සවි කිරීමට නගුලක් ලබා දෙන ලෙස ඉල්ලීමට. දැන් අපට තියෙන ට්‍රැක්ටරය ගෙනාවේ 1972 අප්‍රියෙල් 18 වනදයි. ට්‍රැක්ටරය පදවන අයට අපි පඩියක් ගෙවනවා. ඔවුන් සමාගම මේ ට්‍රැක්ටරයට ට්‍රේලර් එකක් තෑගි දුන්නා. අපි ට්‍රැක්ටරය කුලියට දීලත් අමතර ආදායමක් ලබා ගන්නවා.



ධර්මසේන මහතා සහ තවත් සාමාජිකයෙක් මහන්සියේ ප්‍රතිඵල බලා සතුටු වේ.

මේ අහල පහල ගම්වල ඉන්න අය සමඟ අපි හොඳින් ජීවත් වෙනවා. ආහාර නිෂ්පාදන වැඩ කටයුතුවලදී නොයෙක් බෝග වර්ග වගා කරන්න ගමේ අයට අපි අක්කර 15 ක් විතර තාවකාලිකව දීල තියෙනවා. ගමේ පින්කම්, මරණ ගෙවල් වාගෙ සමාජ කටයුතුවලදී අපි ගමේ අයට උදව් කරනවා. ඒ වගේම අපේ කුඹුරු වැඩවලට ගමේ අය අපට උදව් කරනවා. අපි වැල් දෙඩම් හිටවලා තියෙන ක්‍රමානුකූල විදිය දැන් අවට ගම්වල අයත් අනුගමනය කරනවා.

සමුපකාර ගම්මානය ඇති කළ අලුතදී අපේ සාමාජිකයෝ අදහස් කළා, එක් එක් සාමාජිකයෙකුට වෙන් වෙන්ව ඉඩම් කැබැල්ලක් තියෙනවා නම් හොඳයි කියලා. ඒ වුනත් ඒ විදියට ඉඩම් ලබාගෙන කටයුතු කරගෙන යන වෙනත් අවට තැන්වල එම ක්‍රමය සාර්ථක වෙලා නැහැ. අපේ සාමාජිකයෝ කැමතියි සමුපකාර ක්‍රමය අනුව වැඩ කරලා මේ ගම්මානය අනික් අයට ආදර්ශයක් හැටියට පෙන්වීමට. එක්කෙනෙකුගේ වැඩ කටයුතු හොඳින් සාර්තක වීම සමාජයට එතරම් බලපාන්නේ නැහැ. සමූහයකගේ දියුණුව ලොකු බලපෑමක් ඇති කරනවා. ඒ වගේම සමූහයකගේ අඩු පාඩු වඩාත් හොඳින් ඉදිරිපත් කිරීමට පුළුවන්.

මේ අක්කර 300 ක විතර ඉඩම් ප්‍රමාණයෙන් ලාබ උපදවා ගත්තොත්, ඉන් කොටසක් අපට හිමි වන බව දන්නා නිසා අපි හුඟක් කැමැත්තෙන් කාල වේලා බලන්නේ නැතිව වැඩ කරනවා. අක්කර 300 ක් කියපු වම හුඟක් වටිනා භූමි ප්‍රමාණයක්. දැන් මේ වැඩ කරන්න නතර වෙලා ඉන්න තරුණ පිරිස ඔක්කොම මේ ගම්මානයට ආදරයක් ඇති අයයි. සමහර වෙලාවට උදේ 6.30 විතර ඉඳල රෑ වෙනකල් වැඩ කරනවා.

විනෝදංග ගැන අපි වැඩියක්ම හිත යොදන්නේ නැහැ. එහෙම කරන්න කාලය කුත් නැහැ. චිත්‍ර පටියක් බලන්න වුනත් හුඟක් දුර යන්න තියෙන හින්ද ඒ ගැන කවුරුවත් වැඩි සැළකිල්ලක් දක්වන්නේ නැහැ. අපට ගුවන් විදුලි යන්ත්‍රයක් තෑගි ලැබී තියෙනවා. එහි හැම වැඩ සටහනකටම

වගේ අපි කන් දෙනවා. ගුවන් විදුලියේ කෘෂිකර්ම වැඩ සටහන් ප්‍රයෝජනවත්. ඒවායින් අපි කරන වැඩිලිවලට උපදෙස් ලබා ගන්න පුළුවනි. මම හිතන්නේ, සමුප කාර ගම්මානයක අත්දැකීම් ලබාපු තරුණ අය — ඒ කියන්නේ ඒ වගේම ගම්මානයක වැඩ කරපු තරුණ අයත් ඒ වැඩ සටහන්වලට සහභාගී වෙලා ඔවුන්ගේ අදහස් දක්වනවා නම් වඩාත් හොඳ බවයි.

අපි මෙහෙ වැඩ කරන්නේ කණ්ඩායම් වලට බෙදිලයි. එක් කණ්ඩායමක් අද කරන වැඩ තවත් දවසකදී වෙනත් කණ්ඩායමකට පැවරෙනවා. මේ විදියට හැම අංශයකම වැඩ ගැන සාමාජිකයන්ට දැනීමක් ලැබෙනවා.



තරුණ සාමාජිකයෝ එකමුතුව වැඩ කරති.

වැල් දෙඩම්, එළවළු ආදී අපි වගා කළ බෝග වලින් දැන් ටික ටික පලදාව ලැබෙනවා. ඒ පලදාව දකින කොට අපේ මහන්සියේ ප්‍රතිපල ලැබීම ගැන අපි සතුටට පත් වෙනවා''.

මේ ගම්මානයේ වැඩ කරන **වී. ආර්. ජයරත්න** මහතා වයස අවුරුදු 22 ක තරුණයෙක්. සූරියමල්ගම සමුපකාර ගම්මානය ගැන ඔහු පහත සඳහන් විදියට ප්‍රකාශ කළා.

''මම මේ ගම්මානයට ආවේ 1972 දෙසැම්බර් මාසයේ 4 වනදා. 8 වන පංතිය දක්වා මම ඉගෙන ගෙන තියෙනවා. කලින් වෙළඳාම් කටයුතු කළා, වී මෝලක වැඩ කළා. මගේ ගමට මේ ගම්මානයේ ඉඳලා දුර හැතැප්ම තුනක් විතර ඇති. ඒ වුනත් මම නිතර ගෙදර යන්නේ නැහැ. මුලින්ම නම් මෙහේ වැඩ කරන එක ටිකක් අමාරු වුනා. ඒත් කට්ටියම එක්ක ටික දවසක් වැඩ කරන කොට ඒ අමාරුකම් මග හැරුනා. අපි දැන් ශ්‍රමදානයකින් ලැයිම පිරිසිදු කරගෙන යනවා, ගව ගාලක් ඇති කරන්න. අපට දැන් ලැබෙන පලදාව අපිත් ප්‍රයෝජනයට ගෙන ගමේ අයටත් විකුණනවා. දැන් අපි කරපු වැඩ කටයුතුවල ප්‍රතිපල පෙනෙන්න තියෙන නිසා අපට ඇති වන්නේ සතුටක්. මේ ගම්මානය අත්හැර යාමට මම අදහස් කරන්නේ නැහැ.''

සූරියමල්ගම සමුපකාර ගම්මාන ව්‍යාපාරයේ මුදල් පිළිබඳ ගණන් හිලව් ගැන කටයුතු කරන්න එක් අයෙක් තෝරාගෙන තියෙනවා. ඔහු ව්‍යාපාර කළමනාකරු වශයෙනුයි කටයුතු කරන්නේ. සාමාජිකයින් අතර වැඩිම ඉගෙනීමක් ලබා ඇති මොහුට සමුපකාර පරීක්ෂකවරයෙකුගේ උදව්වත් ලැබෙනවා. ඔහු මේ ව්‍යාපාරය ගැන කතා කරමින් මෙසේ පැවසුවා.

''මගේ නම **එල්. ආර්. පී. බණ්ඩාර.** වයස අවුරුදු 27 යි. හෙට්ටිමුල්ල බණ්ඩාරනායක මහා විද්‍යාලයේදී අ.පො.ස. (උ. පෙ.) මම සමත් වුනා.

මෙම ව්‍යාපාරය පටන් ගැනීමට අපිට රු. 85500/–ක ආධාරයක් ආණ්ඩුවෙන් ලැබුනා. මහජන බැංකුවෙන් රු. 45000/– ක් ලැබුනා. එයින් රු. 28000/– කට ට්‍රැක්ටරයක් අරගෙන ඉතිරි මුදල ආපසු බැංකුවට ගෙව්වා. බුලත්කොහුපිටිය විවිධ සේවා සමුපකාර සමිතිය අපට ද්‍රව්‍ය වලිනුත්, මුදල් වලිනුත් උදව් කළා. දැනුත් අපි උදව්වක් ඉල්ලන වහාම ඒ සමිතියෙන් එය අපට ලැබෙනවා. අපේ සංවර්ධන කටයුතුවලට එම සමිතිය හුඟක්ම උදව් වුනා. මේ ව්‍යාපාරයට ඕනෑ කරන මුදල් ගැන මේ වන තෙක් කිසිම කරදරයක් වුනේ නැහැ.

1972–11–01 වන දින සිට 1973–10–19 දින දක්වා කාලය තුළ තේ වලින් රු.744.50 කුත්, ට්‍රැක්ටරය කුලියට දීමෙන් රු. 1080/– කුත්, අක්කර 8 ක රබර් අලෙවියෙන් රු. 5209.30 කුත් අපට ආදායම් වශයෙන් ලැබුණා. මෙවැනි සුළු ආදායමක් ලැබුණත් අපේ ණය

38 පිටුව බලන්න